ස්වදේශ කටයුතු චක්‍රලේඛ : 02/2019

මගේ අංකය : එච්ඒඑෆ් - 1 / 02/ අයිඩී - 2019

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07.

2019.01.07 දින

දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,

## 71 වන ජාතික දින උළෙල - 2019

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මග පෙන්වීම යටතේ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ මෙහෙයවීමෙන් වර්ෂ 2019 පෙබරවාරි 04 වන දිනට යෙදෙන 71 වන ජාතික දින උළෙල ගාලු මුවදොර දී අභිමානයෙන් යුතුව සැමරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කර ඇත.

02. ඒ අනුව, දිස්ත්‍රික් මට්ටමෙන් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් (බස්නාහිර පළාතේ නාගරික ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හැර - ප්‍රධාන උත්සවය හා සම්බන්ධ වන බැවින්) සියළුම දේශපාලන අධිකාරිය, රජයේ ආයතන හා මහජනතාව එකරාශී කර ගනිමින් ජාතික අභිමානය ඔප්නංවන අයුරින් ප්‍රධාන වැඩසටහනට සමගාමී ජාතික දින උත්සවයන් සංවිධානය කරන ලෙස දන්වමි.

03. තවද, එම උත්සවයන් සංවිධානය වන ආකාරය පිළිබඳ සැළැස්ම 2019.01.16 දිනට පෙර මා වෙත ලැබීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

එච්.ටී.කමල් පත්මසිරි

ලේකම්

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :

1. ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.ස
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු.දැ.ගැ.ස